self to charges of cover-up for favours granted.

## Other Aspects

There is another aspect to this. How did Ravi get the money to pay for the penthouse? The Inland Revenue Department, comes under the Minister of Finance. Why did this department not question Ravi ' wife, Mela, how he got the money. Isn't there another big conflict of interest here to continue to be in charge of that department? We also know that Ravi Karunanayake made a fuss about been suddenly transferred from that portfolio. Why did he want to cling on to that?

Again, from the point of view of public taste, the greed of the Karunanayakae family for luxury living becomes questionable in a country where over 75 per cent of the people are poor and struggling. Are these appropriate values to be displayed by public figures?

## Conclusion

It is abundantly clear that the whole transaction opens the former Minister of Finance and present Minister of Foreign Affairs to very serious charges of corruption. The Commission and courts will decide on that, but we can conclude on ethical grounds that the Minister acted most inappropriately and has lost all credibility to remain a Minister of a yahapalanaya government. He cannot function even as Minister of Lotteries or Minister of Sugar. The yahapalanaya movement, for which I have written to public media so profusely, cannot agree to Ravi continuing as Minister. Keeping him in cabinet would seriously tarnish the public images of President Sirisena and Prime Minister Ranil Wickremasinghe in such a way that they will not be able to take the yahapalanaya program forward.

It is another matter that the very fact that investigators now, unlike during Rajapakse rule, invade the person of powerful political figures is a most refreshing outcome of yahapalanaya.
'

sjturaus@optusnet.com.au



**කුමාරි ජයවර්ධන**
හිටපු විදුහල්පතිනි
හෝමාගම මුල්ලේගම මහා විද්‍යාලය



# විසිරා දුටුවෙමි

පසුගිය මැයි දහතුන්වන සෙනසුරාදා සැඳෑවේ ක්‍රැන්බර්ග් කමියුනිටි තියටර්හිදී එනම් අප මව් බිමේදී නොව විදේශයකදී 'විසිරා' වේදිකා නාට්‍ය නරඹමින් හෝරා දෙකකට පමණ මව්බිමට ඉගිලගොස් ලද ආශ්වාදජනක හැඟීම් මෙසේ ලියමි.

තවද නාට්‍ය කලාව හෝ නාට්‍ය විචාරය පිළිබඳ දැනුමක් නොමැති නමුදු වේදිකා නාට්‍ය හා කලා රසිකයකු ලෙස 'විසිරා' දුටු හැටි පවසනවා විනා මෙය කිසිවිටකත් එහි විචාරයක් හෝ ගුණදොස් හුවා දැක්වීමක් හෝ නොවන බවද පවසමි.

ඕස්ට්‍රේලියාවේ වසන සිංහල දරුවන් හුස්ම ගන්නේත් ඉංග්‍රීසියෙන් යයි අපි සිතා සිටියද අපේ රටේ හද්දා පිටිසරක ගැමි කාන්තාරයක් ඔවුන් වේදිකාවේ ගෙන හැර පෑවේ හෙළ ඌරුව පිළිබඳ කිසිඳු අඩුපාඩුවක් නැතිවය. ඒ ගැමිකම හා අජ්කම ජාන මත්තේ එනම් පරම්පරාගතව එන්නට ඇතැයි කිසිවකුට කිව හැකි මුත් ඒවා මතුකර දෙන්නට, එළියට ගන්නට එහි නිශ්පාදක අධ්‍යක්ෂ කණ්ඩායම මහත් වෙහෙසක් දරන්නට ඇති බවට සැක නැත. එබැවින් එම දරුවනට එසේ හෙළ උරුමය රැකදීමට උර දෙමින් 'විසිරා' වේදිකාවට කැඳවූ සියළු දෙනාට නොමඳ තුති පිදිය යුතුය.

තවද අප දන්නා පරිදි හිරිමල් වියේ සිටම නාට්‍ය සම්මානයන්ට හිමිකම් කියූ කුසුම්සිරි හා කුස පිළිසිඳගත් දා සිටම වේදිකාවේ හුස්ම ගත් යශෝධරා දෙපළ ඕස්ට්‍රේලියාවේ පදිංචි වී මව්බිමේ දරුවනට ශිල්ප නොකොට බලවත් අසාධාරණයක් කරතැයි මා සිත තිබූ කහට සේදී ගියේ අපේ දරුවන් අපේ බස, අපේ හැඩරුව අපේ කම නොඅඩුව වේදිකාව මත මුදා හළ බැවිනි. නමුදු කහට දිය වුනද පැල්ලම් හැරිය නොහැකි ලෙස ඉතිරිව කා වැදී තිබීම පිළිබඳව කීමට ඇත්තේ අපේ වැඩි අනුකම්පාව මව් බිමේ වෙසෙන සිහල දරුවනට වන බවයි. මේ පිළිබඳව කිසිවකු මා ගැන උරණ නොවේවායි පතමි.

හැත්තෑව දශකයේ මුල ඉතා පිටිසරක වූ අප ජීවත් වූ ගමේ සිටි 'කෝටුවා' මට මතක් වෙයි. ගෙයක්, දොරක්, මවක් පියෙක් නොසිටි ඔහු කෑවේ බීවේ ජීවත් වූයේ කාගේ හෝ දෙමළ කෙහෙල් කැනක්, පොල් මල්ලක්, පිං කැටයකින් කාසියක් දෙකක් සොරා ගැනීමෙනි. මේ සොරකම් බොහෝමයක්ම අතටම අසුවී ගම්මුන්ගෙන්, බොහෝ විට ගැමි ගැහැණුන්ගෙන් උදේ හවා බැනුම් ඇසුවද කෝටුවා සිටියේ ඒවා නෑසුන ගානටය. කෙසේ වෙතත් බැනුම් විනා ඔහුට පොඩි පහේ කනේ පහරක් හෝ ගසන්නට කිසිම දිනෙක කිසිම ගැමියෙකුගේ අත එසවුනේ නැත. තරුණ විය පසුවෙද්දී කෝටුවා මියගිය දා මුළු කමම සෝබරව අවමඟුල් කටයුතු අඩුවක් නැතිව සිදු කළා පමණක් නොව ඔහුගේ කිසිදු දොසක් පැවසුවේ නැත. පොල්මල්ලකට හෝ පිං කැටයට විදින්නට විනා කිසිදින පන්සල් වත්ත නොපෑගුවද පන්සලේ ලොකු හාමුදුරුවන්ද කෝටුවාගේ අසරණ බව මිසි කිසිදු වරදක් කීවේ නැත. හතලිස් වසරකට පසු මම එදා ඒ රංග ශාලාවේදී විසිරා තුළින් 'කෝටුවා' දුටිමි. තෙසඟ කෝටුවා පමණක් නොව ඔහුගේ ඇතුලාන්තයද දුටිමි. දුක සැප, හොඳ නොහොද පින්පව්, සාධාරණ අසාධාරණ ආදී නේක හැල - හැප්පිලි සඟවාගෙන මිනී පෙට්ටිගේ නිදා සිටි කෝටුවාගේ මුහුණෝ මා එදා නොදුටු බොහෝ දෑ මෙදා දුටිමි.

වේදිකාවේ සිටි උගතුන් අප කරකවා අතහැරියා නොවේදැයි මොහොතකට සිතුනි. අපිඳු එහෙන් මෙහෙන් යමක් කමක් උගෙන උගත්තු යයි ඔළුවට අරගෙන සිටියා නොවේද යන්නත්, ජීවිතය තුළ නූගත් දෙයහි වපසරිය කොතෙක්ද යන්නත් කාටත් හොරා යටි හිතට තට්ටු කොට විමසා බලන්නට මට හිතුනේ උගතුන්ගේ හැසිරීම් රටාව දුටු විටය. තවද උසස්පෙළ ඉගෙණුම ලබද්දී බාහිර ටියුෂන් පන්තියේ ඉගැන්වූ ඉතා උගත් භෞතික විද්‍යා ගුරුවරයා මට සැනින් මතක් විය. ඔහු ඉගැන්වූ කිසිවක් මට තේරුණේ නැත. නමුදු එය ගුරුවරයාගේ උගත්කමේ දොසක් නොව මගේ මෂ්තිස්කයේ අඩුපාඩුවක් බවද මට වහා මතක් විය.



රාළහාමි ලෙස රඟ පෑ සැබෑ ජීවිතයේ වෛද්‍ය සිසුවා දොස්තර කෙනෙකු දුබල මිනිස් සිරුරු අතන මෙතන කපන කොටන, නලාවකින් කනට වැටෙන හිතේ ලබ් - ඩබ් ශබ්දය මතුපිටින් පමණක්ම හඳුනන ලෙඩ හා ලෙඩ්ඩු සමඟ ජීවත් වන පොතේම ඇලුනු පොත් ගුල්ලන් පිරිසකැයි සිතා සිටි මා වැනි අයගේ සිත් තුළ එවැනි සිතක් ඇති කරගෙන සිටීම පිළිබඳව ලජ්ජාවක් ජනිත කළ බව කිව යුතුය. අහස - පොළව මෙන් දුරස් වූ රාළහාමි භූමිකාවක් දොස්තර භූමිකාවත් අතර ඔහු දෝලනය වන්නට ඇත්තේ කෙසේදැයි තවමත් සිතමි. බොරු බරක් මවාගත් සැහැල්ලු රාළහාමිත් සැහැල්ලුවක් පෙන්වන මුත් බරකින් යුත් වෛද්‍යවරයකුත් එක හිත ගත තුළ එහා මෙහා වන්නට අසීරුවක් වූ බවක් පෙනෙන්නට තිබුනේ නැත. මම අපේ රටේ වේදිකාවේ රඟන වෛද්‍යවරුන් ගැන මතක් කරන්නට අසාර්ථක වෙහෙසක යෙදුනෙමි.

තම තමන්ගේ කිල්ලෝට වල හුණු වසං කරගෙන අනුන්ටම ඇඟිලි දිගුකරන, පහසුවෙන්ම කුලප්පු වන අර වගේම බවලත් ගැහැණු උදවියද කිහිප දෙනෙක්ම අපේ ගමේත් සිටියා මට මතකය. එසේම වදන් කිහිපයකින් රඟහලේ සිත් වසඟ කරගත් පුංචිම පුංචි නළුවාට, ඔහුගේ අනාගතයට මුළු හදින්ම සුභ පතමි.

මා ජීවිතයේ පළමුවරට දුටු වත්සලා ඉෂ්ඨවීර වේදිකාවට පැමිණ "මට කතාකරගත නොහැකි නිසා කතා නොකරමි" යි කීවද ඇගේ කඳුළු පිරි හඟුම් බර දෙනෙතත්, සැලෙන දෙතොලත්, ඇගේ මුනිවතත් කියා ගන්නට තිබූ දිගු කතාවම, නොඅඩුවම සියළු දෙනාගේ සිත් සතන් තුළට දනවමින් අප සසල කළ බව කිව යුතුය. 'විසිරා' සමග ඇය ආ මගෙහි ගල් බොරළු, මල් පොකුරු තුති පිදුම් ද වින්දා වූ උණුසුමද සිහිලස ද, තවත් නොයෙක දේ ද ඒ නිහඬ කතාවේ ගැබ්ව තිබිණි. ලේ කිරි නුදුන්නද සෙනෙහසින් සිප්කිරි පොවා ඇතිදැඩි කළ ආදරණීය දරුවන් කැළ කරලියට නංවා ඔසවා තබා, ඔවුන් ඒ මත්තේ විකුම් පානා කළ නෙත කඳුළු නොපිරෙනා මවක් වෙත්ද ? වත්සලා, ඇය සෙනෙහෙබර සැබෑ ගුරු මාතාවක බව පසක් කළාය.

නාට්‍ය දර්ශනය අවසන බොහෝ වේලාවක් යනතුරු සියල්ලන් සතුට බෙදා ගනිද්දී ඒ මුහුණ මත තිබූ ජයග්‍රාහී සුන්දර රැළි මත්තේ. එතෙක් විසිරා විසින් දෙන ලද සුන්දරත්වය එහි දුක් දෝමනස්සයන් වසා පැතිර තිබූ මෙවන් අවස්ථා සිය දහස් වර හුරු පුරුදුව ඇති බැවින් උපේක්ෂා සහගතව සිටියද, ඒ මුහුණ මතද යම් අමුත්තක් ඇඳී තිබුණා යයි සිතුනි.

ශාලාව කෙමෙන් හිස් වෙද්දී අඩ අඳුරේ තවමත් කඳුළු පිරි නෙතින් නමුදු සොඳුරුබර බලාපොරොත්තු සහගත සිනහවකින් මුව සරසාගෙන සිටි වත්සලා ඉෂ්ඨවීර සිප වැළඳ සුභ පතන්නට සිතුනද මට එය මඟහැරුණි. නැතහොත අහේතුකවම මම එය මඟ හැරියෙමි. නමුදු ඇයටද, ඇගේ දරුවනටද සොඳුරු අනාගතයකට මුළු හදවතින්ම සුභ පැතුවෙමි.

'විසිරා' හි රංග වස්ත්‍ර සැකසීමේදී එයට සුළුවේ සම්බන්ධ වීමේ භාග්‍ය ලද මට, ඒවා වේදිකාවේ දසුන්ගත වෙද්දී, රුව ගුණ කෙබඳුදැයි බලන්නට ඕනෑ කම තිබුනද මට එය මතක් වුනේ නැත.

මාගේ මේ ලිපිය කියවන කෙනෙකු වෙත්නම් " මේ ගැහැණිය රංග ශාලාවට ගොස් 'විසිරා' නොව බලා ඇත්තේ වෙන වෙන විකාර නොවේදැ'යි මා පිළිබඳ තක්සේරුවක යෙදෙන්නට පුළුවන. මට කීමට ඇත්තේ විසිරා නාට්‍ය නරඹා ආපසු එද්දී මට මා ගැන හිතුනේත් ඒ ටිකම බවයි. නමුදු නැවත කල්පනා කරද්දි මට සිතුනේ මා විසිරා නාට්‍ය තුළින් විසිරා පමණක් නොව, මෙතෙක් මා නොදුටු, මට නොපෙනුනු තවත් බොහෝ දේ දුටු බවය.